**#mediaethicsSL #SinhalaPress #lka #Ravaya #March18**

සිදුවීමක් වාර්තා කරමින් ප්‍රවෘත්තියක් ලිවීමේදී හෝ ඒ පිළිබඳ විශේෂාංග ලිපියක් සම්පාදනය කිරීමේදී, මාධ්‍ය ආචාර ධර්මයන් කඩවීම් පැහැදිලිවම පෙනෙනා ලෙසින් මෙන්ම සියුම් ලෙසින්ද සිදුවිය හැක. දකුණු පළාත් සභා මන්ත්‍රී සහ ඔහුගේ බිරිඳ ගැටුමක් නිසාවෙන් පුද්ගලයෙකුට පහර දෙන සිදුවීම රාවය හරහා වාර්තා කර ඇති ආකාරය උදාහරණයක් ලෙසින් ගනිමු.

මෙහිදී ලිපිය ගැටළුවකින් තොරව ගලා ගොස් තිබුණත්, එක් තැනකදී තම මතය ඒ සම්බන්ධයෙන් ප්‍රකාශ කිරීමට යාම නිසා එය වෙනස් ලෙසින් සැලකීමක් දක්වා දිගු වී ඇත. "මෙය බලන කෙනෙකුට ඇය සමග දීග කන මිනිහා ගැන වුව අනුකම්පාවක් ඇතිවිය හැකිය" යනුවෙන් එම කාන්තාව විස්තර කර තිබීම සුදුසු වේද? එතැනදී මන්ත්‍රීවරයාද එම පහරදීමට සම්බන්ධ වුවත්, මෙවැනි අදහසක් කාන්තාව සම්බන්ධයෙන් පමණක් පළවන්නේ මන්ද?